**මන්මුනේ නිරිත ප්‍රාදේශීය සභාව - 2023**
**-----------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මන්මුනේ නිරිත ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මන්මුනේ නිරිත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම )

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීම , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග ලෙස ලැබී තිබූ පොත් 804ක වටිනාකම රු.180,179කින් මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබූ අතර පොත් 445ක වටිනාකම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී, මේ පිළිබඳව අවධානය යොමුකරන බව. | පරිත්‍යාග ලද පොත්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට පියවර ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලී ආදායම් රු.124,435ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ස්ථාවර තැන්පතු පොලී ආදායම් බැංකු වාර්තා පදනම් කරමින් දක්වා තිබූ බව. | වර්ෂයට නියමිත ආදායම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඇ) | කුළුවිනමඩු සහ මනල්පිටිය ග්‍රාමීය ජල සම්පාදන ව්‍යාපෘතියේ භාවිතයේ පවතින වර්ග 14ක වත්කම් 28ක වටිනාකම සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි මූල්‍ය වර්ෂයේ තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කරන බව. | වත්කම් තක්සේරු කර ගිණුම්වල අනාවරණය කළ යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| ඉදිරිපත් නොකළ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.59,625,995 ක් වටිනා ගිණුම් ශේෂ 04 අදාල ස්ථාවර වත්කම් ලේඛනය, හිමිකාරිත්වය සනාථ කිරිම් ලේඛන සහ අනෙකුත් ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අඩුපාඩු සම්පූර්ණ කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගන්නා බව. | ගිණුම් ශේෂ සනාථ කිරීමට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

### 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| (i) | 24(1)(ආ) වගන්තිය | සභා බලප්‍රදේශයට අයත් මාර්ග 253ක් ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කර නොතිබුණි. | අදාල මාර්ග 253ට නම් යොදා ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කිරිමට ක්‍රියාමාර්ග ගනු ලබන බව. | මාර්ග ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කිරිමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) | 128 වගන්තිය | සභාව විසින් පරිහරණය කරනු ලබන දේපළ 12ක අයිතිය පවරා ගැනිමට පියවර ගෙන නොතිබුණි. | දේපළවල අයිතිය පවරා ගැනිමට ලේඛන ඉදිරිපත් කර මිනින්දෝරු සැලැසුම් ලබාගැනීමට පියවර ගෙන ඇති බව. | දේපළවල අයිතිය පවරා ගැනිමට පියවර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.9,785,540ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු. 109,484 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 10,051,250 | 2,860,870 | 2,736,175 | 124,695 | 745,200 | 786,640 | 903,460 | 94,405 |
| කුලී | 1,141,100 | 783,115 | 783,115 | - | 810,100 | 681,350 | 981,350 | - |
| බලපත්‍ර ගාස්තු | 1,925,250 | 3,100,200 | 3,100,200 | - | 1,942,850 | 2,040,920 | 2,040,920 | - |
| වෙනත් ආදායම් | 7,394,000 | 26,895,984 | 9,075,464 | 17,820,520 | 23,212,500 | 38,158,431 | 38,755,715 | 2,796,511 |
| එකතුව | 20,511,600 | 33,640,169 | 15,694,954 | 17,945,215 | 26,710,650 | 41,667,341 | 42,681,445 | 2,890,916 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් ජලය බෙදාහැරීම තුළින් පට්ටිපලෙයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් සහ මහජනතාවගෙන් අයකළ යුතු රු.234,470ක හිඟ ජල ගාස්තු සමාලෝචිත වර්ෂයේ අවසාන දිනටත් අයකර නොතිබුණි. | පට්ටිපලෙයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් සහ මහජනතාවගෙන් ලැබිය යුතු හිඟමුදල් අයකිරීමට පියවර ගන්නා බව. | හිඟ ජල ගාස්තු අයකිරීමට කඩිනමින් පියවර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල නමට වූ වාහන 15ක අයිතිය සභාවේ නමට පවරා ගෙන නොතිබුණි. | වාහනවල හිමිකාරිත්වය මාරු කිරීමට ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව. | වත්කම්වල අයිතිය නොපමාව නිරවුල් කරගත යුතුය. |
| (ආ) | සභාවට අයත් ට්‍රේලරයක් දීර්ඝකාලයක සිට අක්‍රියව පැවැති නමුත් එය අළුත්වැඩියා කර භාවිතා කිරීමට පියවර ගෙන නොතිබුණි. | එය වෙන්දේසියේ විකිණීමට පියවර ගෙන ඇති බව. | වාහන අළුත්වැඩියා කර භාවිතා කිරීමට හෝ්ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කළ කාර්යමණ්ඩල ලැයිස්තු ප්‍රකාරව, ප්‍රථමික මට්ටමේ පුරප්පාඩු 05ක්ද, ද්විතියික මට්ටමේ තනතුරු පුරප්පාඩු 03ක් සහ තෘතියික මට්ටමේ තනතුරු පුරප්පාඩු 08ක් ද පැවැතුණි. | පුරප්පාඩු සම්බන්ධයෙන් අදාල බලධාරීන්ට කාර්තුමය වාර්තා ඉදිරිපත් කර ඇති බව. | පුරප්පාඩු පිරවීමට සුදුසු ක්‍රියාමර්ග ගතයුතුය. |
| (ආ) | සභාවේ සේවය කර 2013 වර්ෂයේ තනතුරු අත්හිටවූ නිලධාරියෙකුගෙන් අයවිය යුතු හිඟ ණය ශේෂය රු.40,868ක් විය. | හිඟ ණය නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින බව. | හිඟහිටි සේවක ණය අයකර ගැනිමට පියවර ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| "ඇ" පන්තියට අයත් ආයතන 07ක් විසින් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාගැනීමට ඉදිරිපත් කළ අයදුම්පත් සෞඛ්‍ය වෛද්‍ය අධිකාරිවරයා විසින් නිර්දේශ නොකර ප්‍රතික්ෂේප කර තිබූ නමුත් එම ආයතන අඛණ්ඩව ව්‍යාපාර කටයුතුවල නිරත වී තිබුණි. | එම ව්‍යාපාරික ආයතනවලට අඩුපාඩු නිවැරදි කිරිමට උපදෙස් ලබාදෙන බව. | අඩුපාඩු නිවැරදි කර පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාදීමට පියවර ගත යුතුය. |